**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2015**

-----------------------------------------------------------------

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.36,310,655 ක වාහන 14 ක් අධිකාරිය විසින් තවදුරටත් ධාවන කටයුතු සඳහා යොදාගන්නා නමුත් එකී වාහනවල සාධාරණ අගයක් පෙන්නුම් කිරීම පිණිස ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17**

කල්බදු ක්‍රමයට මිලදීගෙන තිබුණු වාහන 03 කට අදාල සාධාරණ අගය ගිණුම් ගත කිරීම වෙනුවට ඒ වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,228,028 ක කල්බදු වාරිකවල වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

ආයතනයේ සේවකයකු විසින් රු. 500,000 ක වන්දියක් ඉල්ලා අධිකාරියට එරෙහිව නඩුවක් පවරා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබූ අතර අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් ගිණුම් සටහන්වල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ වටිනාකම රු.195,000 ක් වූ සීසීටීවී කැමරා පද්ධතිය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) වසර ගණනාවකට පෙර කල්බදු පදනමට ලබාගෙන තිබුණු දැනට භාවිතයේ පවතින වාහන 2 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ18 ( 1 ) වගන්තිය | ඉඩමක "මැණික් ගැරීමේ අයිතිවාසිකම වෙන්දේසියකින් අත්කරගෙන ඇත්තාවූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වෙන්දේසියේදී ගෙවන ලද මිලෙහි ඒ ඉඩමෙන් ලැබෙන මැණික් වෙනුවට යම් රාජ්‍ය භාගයක්ද ඇතුළත් ලෙස සලකුණු ලැබිය යුතුය යන්න" දක්වා තිබුණද අධිකාරිය එම රාජ්‍ය භාග ප්‍රතිශතයන් කුමක්ද යන්න තීරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී බොගවන්තලාව සහ තවත් ඉඩම් වෙන්දේසි කිහිපයකින් රු. 352,774,990 ක පමණ ආදායමක් උපයා තිබුණද ඉන් කිසිදු රාජ්‍ය භාග මුදලක් භාණ්ඩාගාරයට ලබා දී නොතිබුණි. |
| (ආ) | 1971 38 දරන මුදල් පනත | |
| | (i) 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.1,317,401,767 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| | (ii) 13(8) වගන්තිය | 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර 2014 වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද විගණන වාර්තා පාලක මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසුව ගැනීමට යෝජිත පියවරයන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.10.1 වගන්තිය හා 1:11:1 වගන්තිය | පත්වීමක් පෙර දාතම් කිරීමට අමාත්‍යාංශ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වුවත්, සහකාර අධ්‍යක්ෂ(තක්සේරු/රත්න විද්‍යාඥ) තනතුරේ පත්වීම පෙරදාතම් කිරීමේදී එසේ සිදු කර නොතිබුණි. තවද පෙර දාතම් කිරීම හේතුවෙන් ඊට පෙර පත්කළ නිළධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයේ වෙනසක් වන්නේ නම් පෙර දාතම් නොකළ යුතුය.එහෙත් ඊට පටහැනිව අධිකාරිය විසින් උක්ත තනතුරේ පත්වීම පෙරදාතම් කර තිබුණි. |
| (ඈ) | 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 වගන්තිය | එක් සේවකයෙකුට වර්ෂය සඳහා ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු. 13,500 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එක් සේවකයෙකුට රු. 55,000 බැගින් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. ඒ අනුව රු. 10,200,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | නිලවාහන හිමි නිළධාරින්ට අතිරේක ඉන්ධන ලබාදීමේදී අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් තොරව නිළධාරීන් 7 ක් සඳහා අධිකාරියේ ඉන්ධන ඇණවුම් මගින් රු. 338,887 ක ඉන්ධන සපයා දී තිබුණි. |
| (ඊ) | 2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි මාස 6 ක කාලයක් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි සියලු අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |

(ඩ) 2015 ජනවාරි 12 දිනැති අංක එන්ජීජේඒ 1/1 දරන අභ්‍යන්තර චක්‍රලේඛය

සහන සේවා ගාස්තු යටතේ මැණික් අපනයනය කිරීම අත්හිටුවා තිබියදී අධිකාරිය විසින් ඊට පටහැනිව සහන සේවා ගාස්තු යටතේ මැණික් අපනයනයට අවසර දී තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 28,500,000 ක පමණ සේවා ගාස්තු ආදායමක් අහිමි වී තිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂය සඳහා දිරිදීමනා ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සියලුම සේවකයින්ට මාස දෙකක (දීමනා සහිතව) දළ වැටුපට සමාන වන සේ එකතුව රු.19,063,370 ක මුදලක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් අධිකාරියේ සියලුම සේවකයින්ට රු. 4,740,075 ක මුදලක්ද ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේද මෙලෙස අනුමැතියකින් තොරව රු. 12,481,405 ක දිරිදීමනා හා රු. 4,611,375 ක් ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු. 246,984,714 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 314,942,235 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 67,957,521 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ඉඩම් වෙන්දේසි ආදායම රු. 216,063,564 කින් වැඩි වී තිබුණද මැණික් විකිණීම් ආදායම සහ අපනයන සේවා ගාස්තු ආදායම රු.199,362,410 කින් අඩුවීම හා විදේශ ප්‍රදර්ශන වියදම රු. 67,033,175 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා (2015 වර්ෂය හැර) බදු පසු ශුද්ධ ලාභයේ සැලකිය යුතු වැඩිවීමක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී අධිකාරියේ සමස්ථ දායකත්වය පිළිවෙලින් රු. 273,309,778 ක් රු. 512,421,306 ක් හා රු. 492,320,370 ක් විය. ඒ අනුව 2013 වර්ෂය සමඟ සැසඳීමේදී 2014 වර්ෂයේ දායකත්වය සියයට 87 කින් වැඩි වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම වැඩි වීම සියයට 80 ක් විය.

(ආ) අධිකාරියේ සේවක සංඛ්‍යාව 2012 වර්ෂයේ සිට සියයට 12 සිට 28 දක්වා පරාසයක් තුළ වැඩි වී තිබුණු අතර සේවක පාරිශ්‍රමික ගෙවීමද අඛණ්ඩව වර්ධනය වී තිබුණි. 2012 වර්ෂයේදී සේවක පාරිශ්‍රමික සඳහා ගෙවීම් රු.114,048,303 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු. 215,451,445 ක් වූයෙන් 2012 වර්ෂයට සාපේක්ෂව එය සියයට 89 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැය විෂයන් 6 කට අදාල වියදම රු. 84,250,063 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණු අතර එම වියදම්වල වැඩිවීමේ ප්‍රතිශතය සියයට 39 සිට සියයට 691 දක්වා වූ පරාසයක විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 4.1 කාර්යසාධනය
----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව අධිකාරිය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වුවත් 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මැණික් හා ස්වර්ණාභරණ අපනයනය කිරීම සියයට 13 කින්ද බලපත්‍ර නිකුත් කිරීම සියයට 8 කින්ද පහත වැටී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව අධිකාරියේ ක්‍රියාකාරකම් හතකට අදාල භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 96 ක මට්ටමක විය.

(ඇ) ක්‍රියාකාරි සැලැස්ම අනුව වටිනා ලෝහ විශ්ලේෂණ අංශය අයිතම් 27,025 ක් පරීක්ෂා කිරිමෙන් රු 13,800,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන් අයිතම් 9,605 ක් සඳහා පරීක්ෂණ වාර්තා නිකුත්කර රු. 3,563,677 ක ආදායමක් පමණක් උපයා තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 33 ක හා මූල්‍ය ප්‍රගතිය සියයට 26 ක අවමයක විය. මෙය ඉකුත් වර්ෂයේ ආදායම හා සංසන්දනයේදී සියයට 24 ක පමණ අඩුවීමකි.

(ඈ) 2014 වර්ෂයේ අයවැය යෝජනාවල හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ අනුමැතියක්ද නොතිබුණු කොළඹ රන් මධ්‍යස්ථානයේ වටිනා ලෝහ විශ්ලේෂණ රසායනාගාරයක් හා මැණික් පරීක්ෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අධිකාරිය රු. 2,900,874 ක මූලික වියදමක් දරා තිබුණි. 2014 වර්ෂයේ සැප්තැම්බර් සිට 2015 දෙසැම්බර් 31 දක්වා රන් ප්‍රමාණය අංශයේ රසායනාගාරය විසින් රු. 44,890 ක්ද, මැණික් පරීක්ෂණ රසායනාගාරය විසින් රු. 347,077 ක ආදායමක්ද උපයා තිබුණි. මේ අනුව එකී කාලසීමාව තුළ රසායනාගාර දෙකේ මුළු ආදායම රු. 391,967 ක් වූ අතර ඊට අදාල ගොඩනැගිලි කුලිය රු. 1,478,400 ක් වූයෙන් ආවරණය කරගත නොහැකි වී තිබූ වියදම රු. 1,086,433 ක් විය.

(ඉ) හානියට පත් මැණික් ඉඩම් යාවත්කාලීන කිරීම හා අතහැර දමන ලද පතල් භූමි වැසීම සඳහා රු. 13,000,000 ක අයවැය ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ඊට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් අයකරන බලපත්‍ර ගාස්තු, අපනයන සේවා ගාස්තු, මැණික් හා ස්වර්ණාභරණ පරීක්ෂණ ගාස්තු හා රාජ්‍ය භාග සම්බන්ධයෙන් ගැසට් නිවේදනයන් ප්‍රසිද්ධ කර මහජනයා දැනුවත් කර නොතිබුණි.

(ආ) මැණික් ඉඩම් වෙන්දේසි කිරීම මගින් බාහිර පාර්ශවයන්ට රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිවාසිකම් ලබාදීමට පනතේ 18 (1) වගන්තිය අනුව අධිකාරියට බලතල ඇති නමුත් ඊට පටහැනි ලෙස බොගවන්තලාව මැණික් ගැරීමේ නියමු ව්‍යාපෘතියට අදාල මැණික් ගැරීම් බලපත්‍රය අධිකාරිය නමින් ලබාගෙන තිබුණි.

(ඇ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 18(2) හා 18(4) වගන්තිය අනුව මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලින් ලැබෙන මැණික් අධිකාරිය වෙත ලබාගෙන ඒවා විකිණීමෙන්

ලැබෙන මුදලින් රාජ්‍ය භාගය ලෙස කොටසක් වෙන්කළ යුතු වුවත් හැරණියාවක, බොගවන්තලාව සහ සීතාවක ගඟ සමස්ථ ව්‍යාපෘතිය(අදියර එක හා දෙක) මගින් රු. 528,786,392 ක මුදලක් උපයා තිබූ අතර එයින් රු. 215,204,760 ක් බාහිර පාර්ශව වෙත ගෙවා තිබුණද රාජ්‍ය භාගය ලෙස කිසිදු මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) මැණික් ගැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියට සම්බන්ධ වන පෞද්ගලික ව්‍යවසායකයා හා අධිකාරිය අතර ලාභ බෙදීමේදී සෑම ව්‍යාපෘතියක් සඳහාම සාධාරණ විනිවිදභාවයකින් යුතු තාර්කික පදනමක් මත එම ප්‍රතිශතය තීරණය කළ යුතුය. එහෙත් පහත ව්‍යාපෘති හතර සැසඳීමේදී ඊට පටහැනි ලෙස එක් එක් ව්‍යවසායකයාට පෞද්ගලික වන සේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිශතය තීරණය කර තිබුණු බැවින් එය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

| ව්‍යාපෘතිය | අධිකාරියට හිමි ලාභ ප්‍රතිශතය(සියයට) | අධිකාරිය ලැබූ ලාභය | ව්‍යවසායකයාට හිමි ලාභ ප්‍රතිශතය(සියයට) | ව්‍යවසායකයාට ගෙවූ මුදල |
|---|---|---|---|---|
| | | රු | | රු |
| සීතාවක( අදියර 1) | 54.50 | 135,868,345 | 25.50 | 63,571,428 |
| සීතාවක( අදියර 2) | 73.25 | 128,247,450 | 6.75 | 11,818,025 |
| හැරණියාවක | 30.0 | 15,948,112 | 51.0 | 27,111,790 |
| බොගවන්තලාව | 30.0 | 9,031,670 | 65.0 | 19,568,618 |

(ඉ) රසායනාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 වර්ෂයේදී රු. 92,948,578 ක මුදලක් ලබාදී තිබුණද එම කටයුත්ත විගණන දිනය වූ 2016 ජූලි දක්වාම ඉටු වී නොතිබුණි. එම මුදල නැවත අධිකාරිය වෙත පවරාගැනීමට පාලක මණ්ඩලය තීරණය කර තිබුණද එකී කටයුතු මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

(ඊ) අනගි මැණික් (PRECIOUS GEMS) අපනයනය සඳහා මිල කිරීමේ දි එකිනෙක ගල් වශයෙන් හඳුනාගෙන මිල තීරණය කළ යුතු වුවත් එසේ නොමැතිව මැණික් ගල් සමූහ වශයෙන්(LOT) මිල නියමකර අපනයනය කර තිබුණි. මේ නිසා මැණික් තොගයේ අගය නිවැරදිව තක්සේරු නොවීමෙන් විකුණුම් මිල ගණන් අවතක්සේරු වීම නිසා අධිකාරියට අයවිය යුතු සේවා ගාස්තු ආදායම අඩුවීමේ අවදානමක් නිරීක්ෂණය විය.

(උ) අධිකාරිය විසින් 2006 වර්ෂයේදී රු. 1,485,680 ක් ගෙවා මිලදීගෙන තිබූ තොග කටයුතු සඳහා වූ පරිගණක මෘදුකාංග පද්ධතිය දෝෂ සහිතව පැවති අතර ඒ වෙනුවට අතින් ලියූ (Manual) ලේඛණ පවත්වා තිබුණි. මෙම ලේඛණ යාවත්කාලීන නොවීම නිසා එම තොරතුරුද නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) වර්ල්ඩ් එක්ස්පෝ ප්‍රදර්ශනය සඳහා අධිකාරිය නියෝජනය කරමින් අපනයනකරුවන් 16 දෙනෙකු සහභාගි කරමින් රු.3,200,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද අපනයනකරුවන් දෙදෙනෙකු සහභාගී වී අධිකාරියට ලැබී තිබුණේ රු. 400,000 ක ආදායමක් පමණි. එහෙත් අධිකාරිය නියෝජනය කරමින් සම්බන්ධ වූ නිලධාරීන් දෙදෙනාගේ සංයුක්ත හා අනියම් දීමනා සඳහා රු. 990,000 ක් වැය කර තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) සීතාවක ගඟ ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ බෙදාදීම වෙනුවෙන් පැවති උත්සවය සඳහා දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් විසින් දරා තිබූ රු.1,107,257 ක වියදම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය

මඟින් ප්‍රතිපූරණය නොකර ඇහැලියගොඩ ප්‍රාදේශීය කාර්යාලය විසින් අධ්‍යක්ෂ මූල්‍යගේ සහතිකයකින් තොරව සහකාර අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) මූල්‍ය සීමාව යටතේ චෙක්පත් 12 කින් ප්‍රතිපූරණය කර තිබුණි.

(ආ) සීතාවක ගඟ මැණික් ගැරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරේ ආදායමින් රු. 17,420,000 ක් විනිවිදභාවකින් තොරව තෝරාගත් ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයින්ට හා සමෘද්ධිලාභී පුද්ගලයින් සඳහාද රු. 16,246,121 ක් ආගමික ස්ථාන හා ප්‍රාදේශීය සභා වෙතද ගෙවා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශයට සමාලෝචිත වර්ෂයේ රු. 93,573,214 ක ස්ථාවර වත්කම් මිලදීගෙන තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ වත්කම් ප්‍රමාණය රු. 123,191,247ක් විය. එයින් රු. 96,942,288 ක වත්කම් 2016 පෙබරවාරි වන විටත් නිශ්ක්‍රීය තත්ත්වයෙන් පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කළමනාකරණ සහකාරවරු 12 ක්ද ක්ෂේත්‍ර සහායකයින් 06 ක්ද බඳවාගෙන තිබුණි.

(ආ) යාන්ත්‍රික පතල් අධීක්ෂක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ සේවකයින් 15 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ක්ෂේත්‍ර සහායක ( අනියම්) ලෙස තනතුරු නාමය වෙනස්කර පත්වීම් ලබා දී තිබුණි.

(ඇ) ඊට අමතරව ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගෙන තිබුණු අනිකුත් සේවකයන් ක්ෂේත්‍ර රාජකාරිවල යෙදීම වෙනුවට ප්‍රධාන කාර්යාලයේ රාජකාරි ඉටුකිරීමට යොදවා තිබුණි.

(ඈ) අධිකාරියේ බඳවාගැනීමේ කාර්ය පටිපාටිය අනුව කළමනාකාර සහකාර තනතුර සඳහා අදාල සුදුසුකම් නොමැති පුද්ගලයෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 380,636 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) අධිකාරියේ නිළධාරින් ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සත්‍ය ඒවාද යන්න අදාල ආයතනවලින් තහවුරු කරගෙන නොතිබුණි.

(ඊ) විධායක නොවන මට්ටමේ නිළධාරින්ට උසස් වීම්, පුහුණුවීම්, හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ දි කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසුව කිසිදු නිළධාරියෙකුගේ කාර්යසාධන ඇගයීමක් සිදුකර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරීන්ගේ පත්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු වුවත් එයට පටහැනිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ද්විතියන පදනම මත අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පරිපාලන සේවයේ නිළධාරියෙකු පත්කර තිබුණද 2016 ජූලි වන විටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඌ) 2011 වර්ෂයට සාපේක්ෂව ඒක සේවක පිරිවැය සමාලෝචිත වර්ෂය වන විට සියයට 66 කින් පමණ වැඩි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

1993 අංක 50 දරණ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14 වගන්තියේ සඳහන් පහත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(i) කර්මාන්තයෙහි දියුණුව උදෙසා විශේෂයෙන්ම තාප පිරියම්කරණය හා මැණික් කැපීම පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම හා දියුණු කිරීම.

(ii) අනාගතයේ බලාපොරොත්තු විය හැකි මිලදී ගන්නන් අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

(iii) මැණික් නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවෙන් බැහැර කිරීම හා නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම.

(iv) ශ්‍රී ලංකාව තුළ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමට රජයේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සබඳකම් ඇති කිරීම.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය ස්වාධීන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ විගණනය පිළිබඳ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණක පෞද්ගලිකව මධ්‍යස්ථ, සාධාරණ, අපක්ෂපාතී ආකල්ප දැරිය යුතු වුවත් අධිකාරියේ අභ්‍යන්තර විගණක එහි සුභසාධක සංගමයේ භාණ්ඩාගාරික ලෙස කටයුතු කිරීම හා රළු මැණික් වෙන්දේසිවල මැණික් තක්සේරු කිරීම් හා ලංසු විවෘත කිරීම් අධීක්ෂණ කාර්යයන් සඳහා සම්බන්ධ වීම මගින් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වයට එය බාධාවක් බව නිරීක්ෂණය විය.

(ඇ) මැණික් ඉඩම් වෙන්දේසි ආදායම හා මැණික් විකුණුම් (විශේෂ ව්‍යාපෘති) ආදායම විගණනය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම මගින් ඉලක්ක කර තිබුණද ඊට අදාල පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

වටිනා ලෝහ විශ්ලේෂණය කිරීමේ රසායනාගාරය සඳහා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් රු.93,245,566 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා තෝරාගෙන තිබූ සැපයුම්කරුවන් සමඟ නෛතික ගිවිසුම්වලට එළඹ නොතිබුණි. තවද එක් ලංසුවක මිල ගණන් සාවද්‍ය ලෙස වෙනස් කිරීම නිසා රු.771,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම් වියදම් හා තථ්‍ය ආදායම් වියදම් අයිතම දහයක සියයට 20 සිට සියයට 472 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ ආදායම් වර්ග දෙකකින් රු. 2,854,498 ක් උපයාගෙන තිබුණි. සමහර අයිතම සඳහා වියදම් පමණක් දක්වා තිබුණි. මේ අනුව අයවැය ලේඛනය තාත්වික පදනමකින් සකස්කර නොමැති බවත් එය ඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන තනතුරට බඳවාගැනීමේදී වැටුප් පියවරයන් 8 ක් ඉදිරියෙන් තබා වැටුප් නියම කර 2013 වර්ෂයේ මැයි සිට වැටුප් ගෙවා තිබීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු. 597,193 ක වැටුප් 2016 මාර්තු වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තියට පටහැනි ලෙස වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව 2012 ඔක්තෝබර් සිට පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශකවරයෙකු ලෙස බඳවාගෙන තිබුණි. ඒ වෙනුවෙන් මාසික දීමනාව සහ අනෙකුත් දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 867,143 ක්ද ඉකුත් දෙවසර තුළ රු.1,733,143 ක මුදලක්ද ගෙවා තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ(අපනයන සේවා/අපනයන අලෙවි) තනතුරට බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර අයදුම්පත් කැඳවා තිබූ අතර ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය 2014 ජනවාරි 03 දින පවත්වා තිබුණි. අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා තිබුණු අයදුම්කරුවන් තිදෙනෙකු සිටියදී සුදුසුකම් සපුරා නොතිබූ පුද්ගලයෙකුට අදාළ පත්වීම ලබා දී ඊට අදාළ වැටුප් හා ඉන්ධන දීමනා ලෙස රු. 2,834,838 ක් සමාලෝචිත වර්ෂය වන විට ගෙවා තිබුණි.

## 5.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

යාන්ත්‍රික මැණික් පතල්වලින් විශාල වශයෙන් පරිසර හානි නිරීක්ෂණය වූ අතර එම පතල් වලවල් පුනරුත්ථාපන කටයුතු දුර්වල බැවින් පරිසරයට මෙන්ම ජනයාගේ සෞඛ්‍යයට බරපතල හානි උදා වී තිබුණි. තවද කුඹුරු ඉඩම් ආශ්‍රිත මැණික් පතල්වලින් එම ඉඩම් වගා කටයුතුවලට යොදාගැනීමට නොහැකි වීමේ අවදානම්ද උදා වී තිබුණි.දෝන පතල් වලින් රත්නපුර දිස්ත්‍රික්කයේ නායයාමේ අවදානමක්ද නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) **ගිණුම්කරණය**

ප්‍රාදේශීය කාර්යාල සඳහා පාලන ගිණුම් නඩත්තු කර නොතිබූ අතර ජ'නල් සටහන් වලට අදාල සංලක්ෂයන් විධිමත් ආකාරයට දක්වා නොතිබුණි.

(ආ) **වාහන පාලනය**

ධාවන සටහන්වල මුල් පිටපත් මාසිකව විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එක් එක් වාහනය වෙනුවෙන් වාහන ධාවන පිරිවැය වාර්තා සකස්කර නොතිබුණි.

(ඇ) **මානව සම්පත් කළමනාකරණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛවලට පටහැනිව බඳවාගැනීම් හා උස්සවීම් සිදුකිරීම් නිරන්තරයෙන් නිරීක්ෂණය වූ අතර අවිධිමත්ව සේවය අවසන්කිරීම් හේතුවෙන් අධිකාරියට එරෙහිව නඩු ගොනු වීම නිසා ඒ සඳහා කාලය හා මුදල් වියදම් වීම. කාර්යාලීය රාජකාරී හා ක්ෂේත්‍ර රාජකාරී සඳහා සේවකයින් අනුයුක්ත කිරීමේදී සේවක සුදුසුකම් පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) **මෙහෙයුම් කටයුතු පාලනය**

(i) **විදේශ ප්‍රදර්ශන සංවිධානය**

අනුමත අය වැය සීමා ඉක්මවා වියදම් දැරීම් හා ප්‍රදර්ශන සංවිධාන කටයුතු සඳහා සුදුසුකම් නොමැති හා ප්‍රවර්ධන කටයුතු විෂයට බාහිර නිළධාරීන්ද විදේශගත වීම් දක්නට තිබුණි.

(ii) **ඉඩම් වෙන්දේසි හා මැණික් වෙන්දේසි**

මැණික් පවතින රජයේ ඉඩම් වල මැණික් ගැරිමට ඉඩම් නිදහස්කර ගැනීමේදී අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා නෛතික කටයුතු දුර්වල මට්ටමක විය.

(iii) **මැණික් අපනයන**

මැණික් අපනයනයේදී මැණික් ගල් වටිනාකම් විශාල ලෙස අවතක්සේරු කිරීම් නිසා අධිකාරියේ සේවා ගාස්තු ආදායම් අඩු වීම.

(ඉ) **තොග පාලනය**

තොග ලෙජරයේ ශේෂය හා භෞතික තොගය අතර ඌනතාවයන් හා අතිරික්තයන් පැවතුණි. ගබඩා අංශය ගිණුම් අංශයේ ගණකාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක විය යුතු වුවද අධිකාරියේ භාණ්ඩ මිලදීගැනීම් හා අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම ගබඩා අංශයත් පවත්වාගෙන යාම සැපයුම් කළමනාකරු යටතේම සිදුකර තිබුණි. මේ හේතුවෙන් තොග පාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.